TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 - II (2019)

### (01) ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති

පැ දෙකයි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. පහත සඳහන් මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) රජයේ නිලධරයා
   (ii) ස්ථිර නිලධරයා
   (iii) අනියම් නිවාඩු
   (iv) පරිවර්තිත දීමනාව
   (v) සුහද ස්ථාන මාරු
   *(ලකුණු 04 × 5 = 20 යි)*

2. (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කළ හැකි පත්කිරීම් මොනවා ද? *(ලකුණු 10 යි)*
   (ii) පත්කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

3. (i) රජයේ සේවයේ නවක පත්වීමක් ලද නිලධාරියකුගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු ලියවිලි දහයක් නම් කරන්න. *(ලකුණු 10 යි)*
   (ii) පරිවාස කාලයට යටත් නිලධරයකු තමා රාජ්‍ය සේවයේ ස්ථිර කිරීම සඳහා සුදුස්සෙකු බව සනාථ කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

4. (i) අතිකාල ගෙවීමේ දී සලකා බැලිය යුතු කාල සීමා පහක් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*
   (ii) රාජකාරි නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් බලපවත්නා විධිවිධාන පහක් සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

5. (i) රජයේ නිවාස ලබා දීමේ දී නිලධරයන් තෝරා ගැනීමේ උපමාන පහක් සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*
   (ii) රජයේ නිවාස සම්බන්ධයෙන් වන බදු කොන්දේසි කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

6. (i) ස්ථාන මාරු ලැබූ රජයේ නිලධරයකු සම්බන්ධයෙන් පූර්ව ආයතන ප්‍රධානියා විසින් නව ආයතන ප්‍රධානියා වෙත යැවිය යුතු ලේඛන නම් කරන්න. *(ලකුණු 10 යි)*
   (ii) දුම්රිය බලපත්‍ර සම්බන්ධයෙන් බලපවත්නා සාමාන්‍ය කොන්දේසි පහක් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

7. (i) රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් වන විධිවිධාන පහක් සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*
   (ii) රජයේ සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තන් අතුරෙන් නැවත රජයේ සේවයේ යෙදවීමට සුදුසුකම් නොලබන්නේ කවුරුන් ද? *(ලකුණු 10 යි)*

***

Department of Examinations Sri Lanka

TO BE PUBLISHED IN THE WEBSITE OF DOE



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 - II (2019)

## (02) මුදල් රෙගුලාසි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පැ දෙකයි

1. (i) 'ඒකාබද්ධ අරමුදල' යනු කුමක් දැයි සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (ii) ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීම සඳහා කෙරෙන ප්‍රතිපාදන ප්‍රධාන වර්ග දෙක සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (iii) අවිනිශ්චිත අවස්ථා අරමුදලින් අත්තිකාරම් මුදලක් ඉවත් කර ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iv) ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ අදියර සඳහන් කරන්න. (ලකුණු 10 යි)

2. (i) 'සවිස්තරාත්මක කාර්ය මණ්ඩල උපලේඛනයට' ඇතුළත් කරුණු සඳහන් කරන්න. (ලකුණු 05 යි)
   (ii) වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී භාවිත කරනු ලබන මූල්‍ය සම්පාදන ප්‍රභවයන් සඳහන් කරන්න. (ලකුණු 05 යි)
   (iii) වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කරනු ලබන ගණන්දීමේ නිලධාරීන් සැලකිලිමත් විය යුතු කරුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 10 යි)

3. (i) ගණන්දීමේ නිලධාරියකු විසින් ආදායම් සම්බන්ධව බලතල පැවරීමේ අවස්ථා සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (ii) ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හා ගණන්දීමේ නිලධාරියා අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (iii) ආදායම් ගණන්දීමේ නිලධාරියා රජයේ ආදායම සම්බන්ධයෙන් වගකිව යුතු කරුණු හයක් සඳහන් කරන්න. (ලකුණු 12 යි)

4. (i) අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමේ පරමාර්ථ කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06 යි)
   (ii) ආදායම් එකතු කිරීමේ නිලධාරියකු විසින් තම ගණන් දීමේ නිලධාරියාට වගකිව යුතු කරුණු හතක් සඳහන් කරන්න. (ලකුණු 14 යි)

5. (i) ගණන් තැබීම, ආරක්ෂාව ඇතුළු සියලු අංශවලින් සතුටුදායක මූල්‍ය පාලන ක්‍රමයක් සංස්ථාපනය කිරීම සඳහා භාණ්ඩාගාරය සිදුකරන කාර්ය පහක් සඳහන් කරන්න. (ලකුණු 10 යි)
   (ii) අමාත්‍යාංශ ලේකම්වරයකු මූල්‍ය පරිපාලනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු කරුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 10 යි)

6. (i) වියදම් සම්බන්ධ බලතල පැවරීමේ අවස්ථා සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (ii) වවුචර සහතික කිරීමේ බලය ඇති නිලධාරියකු සහතික කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 16 යි)

7. පහත සඳහන් කරුණු හතරකට කෙටි සටහන් ලියන්න.
   (i) වීරමොං ක්‍රියාපටිපාටිය
   (ii) විශේෂ ව්‍යවස්ථාපිත අරමුදල
   (iii) අයවැය වර්ගීකරණ ඒකක
   (iv) ඉඩම් හා ගොඩනැගිලි අත්කර ගැනීම
   (v) සැලසුම් සම්පාදන ඒකකය

(ලකුණු 05 × 4 = 20 යි)

* * *

Department of Examinations Sri Lanka